www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

ශ්‍රී ලංකාවේ දේශපාලන අර්බුදය මධ්‍යයේ

# එල්ටීටීඊය මහ බලවතුන්ට යලි සහතික වෙයි

## LTTE offers reassurances to major powers

**විජේ ඩයස් විසිනි**
**2003 දෙසැම්බර් 9**

දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්, නොවැම්බර් 27 දා පැවති සිය වාර්ෂික “විරු දින” කතාවේ දී, සිය සංවිධානය ඊනියා සාම ක්‍රියාදාමයට කැපවීමේ අභිප්‍රායෙන් සිටින බවත් අන්තර් ස්වයං පාලන අධිකාරියක් (අයිඑස්ජීඒ) සඳහා එල්ටීටීඊය ඉදිරිපත් කර ඇති යෝජනා සම්බන්ධයෙන් කොලඹ ආන්ඩුව සමග සාකච්ඡා කිරීමට කැමති බවත් ප්‍රධාන ජාත්‍යන්තර බලවතුනට යලි සහතික වීම පිනිස මහත් වෑයමක් දැරී ය.

කතාව පවත්වන ලද්දේ. යුරෝපීය සංගමයේ විදේශ කටයුතු පිලිබඳ කොමසාරිස් ක්‍රිස් පැටන් ප්‍රභාකරන් හමුවී එල්ටීටීඊය යලි ප්‍රචන්ඩ ක්‍රියාවන්ට අවතීර්න වුව හොත් එයට ජාත්‍යන්තර ප්‍රජාවගේ “වෛරී විවේචනයට” මුහුන දීමට සිදු වනු ඇතැයි අනතුරු ඇඟවීමෙන් පසු දින ය. අයිඑස්ජීඒ යෝජනා එක්සත් ශ්‍රී ලංකාවක රාමුව තුල ඇති කර ගැනෙන “පෙඩරල් විසඳුමක්” සමග ගලපාලීම අසීරු බැවින් තමා එම යෝජනා අවසාන ආස්ථානයක් ලෙස නො සිතන බව පැටන් එල්ටීටීඊ පාලනය යටතේ පවත්නා කිලිනොච්චියේ පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී පැවසී ය.

කොලඹ දී, පැටන්ට ඔහුව “සුදු කොටියකු” ලෙස හෙලා දුටු සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම්වල විරෝධතාවන්ට මුහුන දීමට සිදු විය. ප්‍රභාකරන් සමග මිත්‍රශීලී කතාබහක යෙදෙනවා වෙනුවට පැටන්ගේ සංචාරයේ අරමුන වූයේ. කොලඹ පවත්නා වත්මන් දේශපාලන අර්බුදයේ වාසිය ගැනීමට ක්‍රියා නො කරනු යන තියුනු පනිවිඩය මහ බලවතුන් වෙනුවෙන් එල්ටීටීඊ නායකත්වය වෙත නිකුත් කිරීම යි.

ඔක්තෝබර් 31 දා එල්ටීටීඊය සිය අයිඑස්ජීඒ යෝජනා ඉදිරිපත් කිරීමෙන් යන්තම් දින කිහිපයකට පසුව, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග, එල්ටීටීඊයට උවමනාවට වඩා සහන දීම මගින් ජාතික ආරක්ෂාවට යටින් වල කපා ඇතැයි අගමැති රනිල් වික්‍රමසිංහගේ ආන්ඩුවට චෝදනා කලා ය. මූලික අමාත්‍යංශ තුනක් පවරාගැනීමට, පාර්ලිමේන්තුව සති තුනකට අත්හිටුවීමට හා හදිසි නීතිය පැනවීම දෙසට පියවර ගැනීමට ඇය ජනාධිපති ලෙස තමන් සතු අත්තනෝමතික බලතල පාවිච්චි කලා ය.

තමා පැටන්ගේ පනිවිඩය අවබෝධ කර ගත් බව පෙන්නුම් කරනු පිනිස ප්‍රභාකරන් සිය “විරු දින” කතාව යොදා ගති. එල්ටීටීඊය සිය මිලිටරි ව්‍යුහය ශක්තිමක් කර ගනිමින් යුද්ධය සඳහා සූදානම් වන බවට පවත්නා චෝදනා ඔහු “උදක්ම ප්‍රතික්ෂේප” කලේ ය. ශ්‍රී ලංකා මිලිටරියේ ප්‍රකෝපකරන නො තකා එල්ටීටීඊය වසර දෙකක් තිස්සේ සටන් විරාම ගිවිසුමට බැඳී සිටිය බව පෙන්වා දෙමින් “අපි සාම ක්‍රියාදාමයට ගැඹුරින්ම කැප වී සිටිමු” යයි ඔහු පැවසී ය.

අයිඑස්ජීඒ යෝජනා “වෙනම රාජ්‍යයක් සඳහා ව්‍යාපෘතියක් ලෙස වැරදි ලෙස අර්ථකථනය” කෙරී ඇතැයි එල්ටීටීඊ නායකයා අවධාරනය කලේ ය. පසුගිය වසරේ සාකච්ඡා ආරම්භයේ දී, එල්ටීටීඊය, දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත්වල දෙමල ඊලම් වෙනම රාජ්‍යයක් ගොඩනැගීමේ සිය දිගුකාලීනව පැවති ඉල්ලීම නිල වසයෙන් අතහැර දැමී ය. අයිඑස්ජීඒ සැලසුම් හා අන්තර් පාලනයක් සම්බන්ධ ආන්ඩුවේ ම යෝජනා යන දෙකම, අප්‍රේල් මස බිඳ වැටුනු සාකච්ඡා යලි ඇරඹීමේ ප්‍රයත්නයෝ ය.

ප්‍රභාකරන්ගේ කතාව වනාහි කොලඹ ආන්ඩුව සමග බලය බෙදාගැනීමේ එකඟතාවකට පැමිනෙන ලෙස එල්ටීටීඊය මත එල්ල කෙරී ඇති උත්සන්න ජාත්‍යන්තර පීඩනය පිලිබඳ මිම්මකි. පසුගිය දශක දෙකක කාලයක් තිස්සේ ව්‍යසනකාරී යුද්ධය නොතතා සිටි එක්සත් ජනපදය සහ යුරෝපීය බලවත්තු, දැන් එය සලකන්නේ, වැඩෙන ආර්ථික හා මුලෝපායික වැදගත්කමක් සහිත කලාපයක භයානක අස්ථායිකරන බලපෑමක් ලෙස ය. වොෂිංටනය එල්ටීටීඊය දිගටම “ත්‍රස්තවාදී සංවිධානයක්” ලෙස හංවඩු ගැසීමේ යෙදී සිටින්නේ, එය තම නියෝගයන්ට කීකරු වීමට අපොහොසත් වුව හොත් මිලිටරිමයව ඉලක්ක විය හැකි බවට ඇඟවුම් කරමිනි.

එල්ටීටීඊය, තමන්ගේ පාර්ශ්වයෙන්, කම්කරු පන්තිය ආන්ඩු මට්ටු කිරීමෙහි ලා සහ දිවයින විදේශ ආයෝජකයන් සඳහා ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කිරීමෙහි ලා කොලඹ ආන්ඩුවේ කනිෂ්ඨ හවුල්කරුවකු ලෙස ක්‍රියා කිරීමේ සිය කැමැත්ත දැනටමත් පෙන්නුම් කර ඇත. ශ්‍රී ලංකාව “ව්‍යාඝ්‍ර ආර්ථිකයක්” බවට පත් කිරීමේ සැලසුම්වලට එල්ටීටීඊය

සහාය දෙන බව, පසුගිය වසරේ පැවති සාකච්ඡාවල පලමු වටයේ දී ම, එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් ප්‍රකාශ කලේ ය. කොලඹ ආන්ඩුවට හා මහ බලවතුන්ට එල්ටීටීඊයේ අනුගත වීම. දෙමල ඊලම් නමින් වෙනම ධනපති රාජ්‍ය නට්ටක් සඳහා වූ එහි පෙර ඉල්ලීමෙන් බිඳීමක් නො ව එහි තර්කානුකූල ඵලය යි.

එල්ටීටීඊයේ යෝජනාවල "ප්‍රගතිශීලී, නිර්මානාත්මක හා අභිනව අංග" ඇතුලත් බව සිය "වීරු දින" කතාවේ දී ප්‍රභාකරන් ප්‍රකාශ කලේ ය. කෙසේ වෙතත්. යෝජිත අයිඑස්ජීඒ සැලසුම්වල මොන ම ප්‍රගතිශීලී අංගයක් වත් නැත. ප්‍රජාතන්ත්‍ර අයිතීන් හා ශිෂ්ඨ ජීවන කොන්දේසි සඳහා දෙමල මහජනතාවන් තුල පවත්නා අභිලාෂයන් ඉෂ්ඨ කරනු වෙනුවට, මෙම සැලසුම් මගින් කෙරෙනුයේ පටු වරප්‍රසාදිත ප්‍රභූ පැලැන්තියක අවශ්‍යතාවන්ට සේවය කරනු ඇති තෝරා පත් කර නො ගැනෙන මන්ඩලයක් උතුරු නැගෙනහිර පලාත්වල ඇටවීමයි.

එල්ටීටීඊය විසින් ඉදිරිපත් කල යෝජනා ද කොලඹ ආන්ඩුවේ යෝජනා ද අතර සැලකිය යුතු වෙනස්කම් පවතී. එහෙත් විශේෂයෙන් ම සිත් කා වදින කාරනාව නම්, ඒවායේ මූලික සමානකමයි: එනම් එම යෝජනා දෙක ම, මුලුමනින් ම ප්‍රජාතන්ත්‍ර විරෝධී වීම හා ජාතිවාදී පදනමකින් පත් කෙරුනු පුද්ගලයන්ගෙන් සමන්විත මන්ඩලයක් උතුරු නැගෙනහිර පලාත්වල ජනතාව මත පැටවීමක් සිදු කිරීම යි.

## එල්ටීටීඊයේ යෝජනා

අයිඑස්ජීඒ සමන්විත වනු ඇත්තේ, එල්ටීටීඊය, ආන්ඩුව හා මුස්ලිම් ජාතිවාදී සංවිධාන විසින් පිලිවෙලින් තෝරා ගැනෙන දෙමල, සිංහල හා මුස්ලිම් නියෝජිතයන්ගෙනි. එල්ටීටීඊයට එහි බහුතරයක් සහතික කෙරෙන අතර, ආන්ඩුවේ යෝජනා මෙන් නො ව, අයිඑස්ජීඒ සභාපති තෝරාගැනීම සම්බන්ධ සඵල බලය ද එයට ලැබෙනු ඇත. සභාපතිට, ප්‍රධාන පරිපාලක සහ සෙසු නිලධාරින් පත් කිරීම හා ඉවත් කිරීම ඇතුලත්ව උතුරු නැගෙනහිර පලාත්වල පරිපාලනය සම්බන්ධයෙන් පුලුල් බලතල හිමි වනු ඇත. මෙම මන්ඩලය වසර පහක කාලයක් බලයේ සිටිනු ඇත.

අයිඑස්ජීඒහි තමන්ට බහුතරයක් ලැබීම යුක්තියුක්ත කරගනු පිනිස, එල්ටීටීඊය සිය යෝජනාවල පූර්විකාවේ ප්‍රකාශ කොට ඇත්තේ තම සංවිධානය පමනක් ම දෙමල ජනතාවගේ "අව්‍යාජ නියෝජිතයා" වන බවයි. එල්ටීටීඊයේ මෙම කියාපෑම බොහෝ සෙයින් පදනම් වන්නේ. එය නියෝජනය කරන බව කියන ජනතාවටම එරෙහිව එල්ල කෙරුනු එහි අධිපතිවාදී පියවරවල දිගු ඉතිහාසයක් මත ය. ශ්‍රී ලංකා මිලිටරියට එරෙහි සන්නද්ධ අරගලයේ නාමයෙන්, එය, දේශපාලනික හා සමාජීය ඉල්ලීම් මතු කල ඕනෑම විරුද්ධත්වයක් ප්‍රචන්ඩ ලෙස මර්දනය කිරීමට කටයුතු කොට තිබේ. මෙය වඩාත්ම පැහැදිලිව ප්‍රකාශයට පත් වන්නේ සිය සමාජවාදී විරුද්ධවාදීනට එරෙහිව එල්ටීටීඊය ගත් ක්‍රියාමාර්ග තුල ය. එනම්. 1998 දී වන්නියේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සාමාජිකයන් අත් අඩංගුවේ රඳවා ගැනීම සහ 2002 දී කයිට්ස් දූපතේ සසප සාමාජිකයනට එරෙහිව එල්ල කෙරුනු මරනීය තර්ජනයන් තුල ය.

එල්ටීටීඊයට පුලුල් බලතල හිමිවනු ඇත්තේ අයිඑස්ජීඒ සම්බන්ධයෙන් පමනක් නො වේ. උතුරු හා නැගෙනහිර පලාත්වල දිස්ත්‍රික්ක අට තුල පිහිටුවීමට නියමිත පරිපාලන කමිටු සම්බන්ධයෙන් ද එය එවන් පුලුල් බලතල භුක්ති විඳිනු ඇත. එල්ටීටීඊ යෝජනා යටතේ: "අයිඑස්ජීඒ, දිස්ත්‍රික්ක තුල පරිපාලනය ගෙනයනු පිනිස දිස්ත්‍රික් කමිටු තනන අතර අයිඑස්ජීඒ තීන්දු කරන බලතල එවන් කමිටුවලට පවරනු ඇත." පවත්නා තෝරා පත් කරගත් පලාත් පාලන ආයතන බල රහිත කෙරෙනු ඇත.

අයිඑස්ජීඒ යෝජනා මගින්. එල්ටීටීඊය උතුරු නැගෙනහිර පලාත්වල බලධාරිත්වයට වඩා පැහැදිලිව ඔසවා තැබෙන අතර, ආන්ඩුවේ සැලසුම් සමග එහි පවතින ප්‍රධාන වෙනස නම් එම මන්ඩලයේ බලතලවල පරිමාවයි. අයිඑස්ජීඒ මන්ඩලයට ආන්ඩුවේ යෝජනාවලට අයත් නො වන ක්ෂේත්‍ර ගනනාවක් -- අතිශයින් ම මතභේදාත්මක කාරනා වන ආදායම් ඉපැයීම, නීතිය හා සාමය සහ ඉඩම් -- සම්බන්ධයෙන් "පූර්න" එනම් අසීමිත බලතල හිමි වනු ඇත.

නැගෙනහිර ශ්‍රී ලංකාවේ මුස්ලිම් බහුතරයක් සහිත ප්‍රදේශවල බදු, ඉඩම් හා පාලනය සම්බන්ධ එල්ටීටීඊයේ පිලිවෙත් අරබයා තියුනු හා සමහර විට ප්‍රචන්ඩ ජාතිවාදී ගැටුම් දැනටමත් පැන නැගී තිබේ. මෙම ගැටුම් මගින් අවධාරනය කෙරෙන කාරනාව නම්, ආන්ඩුව හා එල්ටීටීඊය විසින් යෝජනා කර ඇති විසඳුම් ගැටුම අවසානයක් කරා ගෙන එනවා වෙනුවට, ජාතිවාදීව පදනම් වූ සංවිධාන ශක්තිමත් කොට අනාගත ආතතීන් හා ගැටුම් සඳහා මාවත සැකසීමට පමනක් තුඩු දෙනු ඇති බවයි.

දේශීයව හා විදේශීයව නය ගැනීම, ඇපකර හා හානි රක්ෂන සැපයීම, සාජු ආධාර ලබා ගැනීම සහ දේශීය හා විදේශ වෙලඳාමෙහි යෙදීම හෝ එම කටයුතු නියාමනය කිරීම ඇතුලු පුලුල් ආර්ථික බලතල අයිඑස්ජීඒ මන්ඩලයට හිමි වනු ඇත. එයට අමතරව, සෙසු රාජ්‍ය හා ආයතන සමග ඇති කර ගැනෙන ගිවිසුම් හරහා ලැබෙන උතුරු-නැගෙනහිර පලාත්වලට විශේෂයෙන් වෙන් කෙරුනු අරමුදල් සියල්ල පාලනය කිරීම ද අයිඑස්ජීඒ විසින් කෙරෙනු ඇත. යාබද සාගර පෙදෙස්වල මුහුදු හා වෙරලබඩ සම්පත්වල පාලනය ද එල්ටීටීඊය විසින් ඉල්ලා ඇත.

උතුරු හා නැගෙනහිර ප්‍රදේශ එක්සත් ශ්‍රී ලංකා රාජ්‍යයක රාමුව තුල දිගටම පවතිනු ඇතැයි එල්ටීටීඊය පිලිගෙන ඇති අතරම, යෝජිත ව්‍යුහය වඩා ලිහිල් ෆෙඩරේෂනයකි. පැන නගිනු ඇති ඕනෑම මතභේදයක් විසඳනු ලබන්නේ ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ රාමුව තුල නො ව ඒ වෙනුවට සාම ක්‍රියාදාමයේ වත්මන් සත්කාර පාර්ශ්වය

වන නෝර්වේ රටේ මැදිහත් වීම තුලින් හා අවසානයේ දී, ජාත්‍යන්තර යුක්ති අධිකරනය විසින් ප්‍රධාන සභාපති තනතුර තීන්දු කෙරෙනු ඇති විනිශ්චය සභාවක් මගිනි.

දෙමල සුලුතරයට කිසිදු සහනයක් දීමට විරුද්ධ වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා සිහල උරුමය වැනි සිංහල අන්තවාදී කන්ඩායම්, එල්ටීටීඊයේ යෝජනා වෙනම දෙමල ඊලමක් තැනීමේ ආරම්භක පියවරක් ලෙස එක හෙලාම ක්ෂනිකවම ප්‍රතික්ෂේප කලහ. කුමාරතුංගගේ පොදු පෙරමුනේ කොටස්වල ද සහාය ලද ඔවුන්ගේ විරෝධය, ආරක්ෂක, අභ්‍යන්තර කටයුතු හා ජනමාධ්‍ය අමාත්‍යංශ පවරාගැනීමේ ජනාධිපතිනියගේ තීන්දුව තුල යම් ක්‍රියාකලාපයක් ඉෂ්ඨ කල බව නිසැක ය.

තම යෝජනා සාකච්ඡාව පිනිස ය යන්න, එල්ටීටීඊය, ඔවුන්ගේ පාර්ශ්වයෙන්, පුනපුනා අවධාරනය කර ඇත. තමන් පුලුල් බලතල ඉල්ලා සිටීම විවේචනයට ලක් කරන අයට එල්ටීටීඊය පෙන්වා දී ඇත්තේ. වර්තමානයේ සිය පාලනය යටතේ පවත්නා උතුරු හා නැගෙනහිර පලාත්වල සැලකිය යුතු ප්‍රදේශවල තමන් දැනටමත් එවන් බලතල භුක්ති විඳින බවයි.

සිංහල අන්තවාදීන්ගේ විරුද්ධත්වය මෙන් ම අර්ථභාරී වන්නේ, කෙසේ වෙතත්, ආන්ඩුව, බහුතර මාධ්‍ය සහ ව්‍යාපාරික නායකයන් එල්ටීටීඊයේ යෝජනා සාකච්ඡා යලි ඇරඹීමේ පදනම ලෙස පොදුවේ පිලිගෙන ඇත යන කාරනාවයි. දශකයකට, නැති නම් පස් වසරකට පවා ඉහත දී, එවන් සැලසුමක්, සිංහල ස්වෝත්තමවාදයේ ගැඹුරින්ම ගිලී පවතින සමස්ත දේශපාලන සංස්ථාපිතයේ ම හෙලා දැකීමට ලක් වීමට ඉඩ තිබුනි.

පාලක ප්‍රභූවේ වඩාත්ම බලගතු කොටස් ගනන් බලන්නේ, ශ්‍රී ලංකාව භූගෝලීය ආර්ථිකයට ඒකාග්‍ර කිරීමටත් දකුනු ආසියාවේ විවෘත වන ව්‍යාපාරික අවස්ථාවන්ගේ වාසිය ඩැහැගැනීමටත් තමන්ට හැකි වන්නේ යුද්ධය අවසන් කොට එල්ටීටීඊය කනිෂ්ඨ හවුල්කරුවකු හා පොලිස්කාරයකු ලෙස යොදාගැනීම මගින් ම පමනක් බවයි. උතුරු හා නැගෙනහිර පලාත් සඳහා ඉදිරිපත් කෙරී ඇති යෝජනා මාලා දෙකෙහිම ස්වභාවය වනාහි, සාම ක්‍රියාදාමයේ අත්‍යන්ත කොටසක් වන ආර්ථික ප්‍රතිව්‍යුහගතකරන න්‍යාය පත්‍රය ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පැටවිය නො හැකි ය යන්න පිලිබඳව කම්කරු පන්තිය වෙත කෙරෙන අනතුරු ඇඟවීමකි.

ප්‍රභාකරන්ගේ “විරු දින” කතාවේ එල්ලය වූයේ, කොලඹ දේශපාලන අර්බුදය සහ හිරවී ඇති සාම සාකච්ඡාවල අඛන්ඩ අවුල තිබිය දී ම, එල්ටීටීඊය “වගකීමකින්” යුක්තව දිගටම ක්‍රියා කරන බවට අධිරාජ්‍ය බලවතුනට යලි සහතික වීමයි. එල්ටීටීඊය කතා කරන්නේ දෙමල මහජනයා වෙනුවෙන් නො ව, තමන් සඳහා ලාභවලින් පංගුවක් වෙන් කරගැනීමේ අභිලාෂයෙන් පෙලෙන තුනී වරප්‍රසාදිත ප්‍රභූ පැලැන්තියක් වෙනුවෙන් ය යන කරුන එමගින් තහවුරු වේ.

© www.wsws.org